ජගත් ජේ එදිරිසිංහ

# කටු 3

තිසර සූරියබණ්ඩාර ගේ කාමරයෙන් පිටවූ මදාරා කඩිනමින් පඩි පෙළ බැස්සා ය. වචනයෙන් කිව නොහැකි තරම් මහත් වූ අපුලකින් ඇගේ සිත පිරී පැවතුණි. ඒ මූසල නිවහන තුළ සිදුවූ කිසිවක් නැවත සිහිපත් නොකරන්නට ඇය වග බලා ගත්තා ය. වඩා නිවැරදිව කියනවා නම් සිහිපත් කරන්නට තරම් දෙයක් ඇගේ සිතේ රැඳී නොතිබුණි. තිසර ගේ ඇඳ මත හිත් පිත් නැතිව වැතිර සිටි මුලු කාලය තුළ ම ඇගේ මතකයේ රැඳුනේ එක් මොහොතක ඇසුණ දුම්රියක ගොරහැඩි ඝෝෂාව පමණකි. ඒ හඬ කොයි තරම් ළඟින් ඇසුණිද? ඒ දුම්රිය ජීවිතයත් ආත්මයත් යටකරගෙන යන්නාක් මෙන් ඒ මොහොතේ ඇයට දැනුණි.

"මදාරා.." තිසර ගේ කෙඳිරිලි හඬ ඇගේ කන අසළම දෝංකාර දුන්නේ ය. ඔහුගේ දැඩි හුස්මේ උණුසුමින් ඇගේ සියුමැළි කන්පෙති දැවී ගියේ ය.

දවසේ දවසන් හිරු රැස් කදම්බ විලෝ ගස් පේලිය අතරින් රිංගා පැමිණ පඩිපෙළ මත පතිතව ඇත. සුළඟින් සෙළවෙන උස් ගස් පෙළ යෝධයින් සේ මේ නිවහන වසාගෙන සිටින්නේ සියලු රහස් රැක ගන්නට සැරසීගත්තා සේ ය. මුහුදු වතුරෙන් තෙත බරිත සුළඟේ බර නැහැයට දැනෙයි. එහි රැඳුණ පිළී ගඳ දරා ගත නොහැකි තරම් ය.

මදාරා අවසන් පඩිය මත වාඩි වූවා ය. මෙවන් මොහොතක කළ යුතු බලාපොරොත්තු විය යුතු වඩාත්ම ප්‍රායෝගික හැසිරීම කඳුළු වැගිරවීමයි. එහෙත් පුදුමයට මෙන් එවන් කිසිදු හැඟීමක් ඇගේ සිතේ ඇති නොවුණි. මේ ගනුදෙනුව බලහත්කාරයක් නොවේ. අහම්බයක් ද නොවේ. සැළසුම් කළ සහ සැළසුමට එකඟව සිදුවුණ සිදුවීමක් පමණි.

"මං උඹව සල්ලි වලට ගත්තා සර්.." ඇගේ යටි සිත කීවේ ය. මුදලින් නොගෙව්වද සිදුවූයේ එය නොවේ ද?

අවුල්ව ගිය හිසකෙස් දෑතින්ම සකස් කර ගත් මදාරා නැගී සිටියා ය. පටු මාවත ඔස්සේ ගාලු පාරට ආ ඇය බසයක් වෙනුවෙන් කාලය වැය නොකර ත්‍රීවිලරයකට ගොඩ වූවා ය.

නේවාසිකාගාරය ඉදිරියේ රියෙන් බසින්නට පෙර ඇය අත් බෑගයේ වූ කුඩා කණ්නාඩියෙන් මුහුණ බලාගත්තා ය. කිසිවෙකුට සොයා ගත හැකි ආකාරයේ කිසිදු වෙනසක් නැත. බාහිරින්, මේ සිටින්නේ අද උදයේ නේවාසිකාගාරයෙන් පිටව ගිය මදාරා ම ය.

මදාරා දොරින් ඇතුළු වන විට විශාඛා සාලයේ වාඩි වී සිටිනු පෙනුණි. විශාඛා සිටියේ රූපවාහිණියට නොත් යොමා ගත්වනම ය. යෙහෙළිය ගේ මුහුණ නොබලා ම සිය කාමරයට ගිය මදාරා ඇඳුම් උණා දා තුවාය ඇඟ වටා දවටා ගත්තා ය. නාන කාමරයට වැදුණ ඇය වතුර මලට හිස ඇල්ලුවා ය. කොපමණ වේලාවක් එසේ සිටියාදැයි නිනව්වක් ඇයට නොවී ය.

"දැන් මදිද..? උඹ දියවෙලා යාවි.." විශාඛා සාලයේ සිට කෑ ගසා කියන තෙක්ම මදාරා එක සීරුවට නෑවා ය.

"මං කවදාවත් දියවෙන ගෑනියෙක් නෙවෙයි සහෝදරී.." කරාමය වසා දැමූ මදාරා නාන කාමරයේ සිට ම කෑ ගැසුවා ය.

"මොකද අපි නොදන්නෙ.. උඹ ගලක් කියල දැනගෙන ගොඩක් කල්"

"අන්න හරි.. මං ගලක්.. ඕනෙම අභියෝගයකට මුහුණ දෙන්න බය නැති .. කාගෙන ඉස්සරහටම යන.." මදාරා එසේ කීවේ නැත. සිතුවා පමණකි. යන්නට බොහෝ දුර ඇත. කිසිවකුට ඒවා කියන්නට අවශ්‍ය නැත. මොනයම් හෝ ක්‍රමයකින් සියල්ල ලබා ගත යුතුය යන්න පමණක් දැඩි අදිටනක් සේ ඇගේ සිතේ ඇඳී රැඳී තිබුණි.

00000

විදුල ගේ ජංගම දුරකතනය නාද වෙයි. සමදරා ගේ අංකය එහි තිරය මත සටහන්ව තිබෙනු ඔහු දකියි. ඔහු මදාරා දෙස බලන්නේ දුරකතනයට කතා කරන්නට අවසර ඉල්ලා සිටින්නටය. මදාරා සියුම් හිස සෙළවීමකින් ඔහුට අවසර දෙයි.

"ලේකම්තුමිය.. මම ලොකු වැඩක ඉන්නෙ.. හදිසියක් ද?" සමදරා කතා කරන්නට පෙර ම විදුල කතා කළේ ය.
"උඹට ඉතින් ලොකු වැඩ නැත්තෙ කොයි වෙලාවෙද?" සමදරා සිනාසෙනු විදුලට ඇසුණි.

"මේක වැදගත් වැඩක්.."

"උඹේ මොන වැඩේද වැදගත් නොවුණෙ..? මටත් තියෙන්නෙ වැදගත් කතාවක්.. මට දැන්ම උඹ හමුවෙන්න ඕනෙ මහත්තයා.."

"දැන්..?"

"ඔව්.. මේ දැන්.. ස්ථිර ලේකම් වුණාට මගේ මේ අස්ථිර රස්සාව බේර ගන්න මට මේ දැන්ම උඹ හමුවෙන්න ඕනෙ"

විදුල මොහොතක් කල්පනා කළේ ය. මදරා ගේ කතාව අතර මග නවතා යන්නට ඔහුගේ සිත ඉඩ නොදෙයි.

"විදුල දැන් කොහෙද ඉන්නෙ..? මං එන්නං.."

"සහන සේවා පදනමේ ලේඩීස් හොස්ටල් එකේ.. උඹ මෙතෙන්ට එන්ඩ එපා සාමා.. මං අමාත්‍යාංශෙට එන්නං.." සමදරා ගේ ඔලොක්කු සිනාව අනෙක් කෙළවරින් ඇසුණි. ඒ සිනාව විදුල ගේ සිතේ ඇති කළේ කෝපයකි. "මෙතන මගුල් හිතන්ඩ එපා.. මං ආවෙ මගේ රස්සාවට.. තව පැයකින් මං උඹේ ඔෆිස් එකට එන්නං"

"පැයක් ඇද්ද..? ආව රාජකාරිය නිවී සැනසිල්ලේ ඉවර කරලාම වරෙන්.." සමදරා ගේ සිනාව නැවතත් ඇසෙයි.

000000

කාර්යාල කාර්ය සහායකවරයා බන්දේසියක තබා ගෙන ආ තේ කෝප්පය අතට ගත් විදුල එය මේසය මත තබා සමදරා දෙස බැලුවේ ය.
"තේ එක බීලම කතා කරමු" ඈ කීවා ය.

තේ කෝප්පය බොන්නට පෙර දුම් උගුරක් බීමේ දැඩි අවශ්‍යතාවක් විදුලට දැනෙයි. මෙතැන දුම්පානය කරන්නට හැකියාවක් නැත. මේ කරදරකාරී පුරුද්දෙන් ඉක්මණින් අත්මිදිය යුතු යයි නැවත වතාවක් ඔහුට සිතුණි. විදුල තේ උගුරක් බීවේ ය.

"ඉතින්.." ඔහු සමදරා දෙස බලා ඇසුවේ ය.

"උදේ ඇමතිතුමා කතා කළා.." සමදරා දිග කතාවකට මුල පුරන්නා සේ කීවා ය.

"රස්සාවෙ අස්ථිර කම ගැන කියනකොටම මං හිතුව.." විදුල සිනාසුණේ ය. ".. මොකක් හරි ලෙඩක් වෙන්ඩ ඇති"

"ලෙඩක් නෙවෙයි.. වැඩක්.. ඇමතිතුමාට අවශ්‍ය වෙලා තියෙනවා අමාත්‍යාංශයෙන් වෙන වැඩ ගැන ටෙලි ඩොකියුමන්ට්‍රි එකක් කරන්න.. ඩොකියුමන්ට්‍රි එකක් කිව්වට නිකම්ම වාර්තා වැඩසටහනක් නෙවෙයි.. මොකක් හරි කතාවක් එක්ක දිගඇරෙන විස්තරයක්.."

"ඉතින්"

"මේකට උඹේ නම යෝජනා කළේ ඇමතිම තමයි.. මිනිහට ඕනෙ උඹ ලවා මේක නිර්මාණය කරවගන්න"

විදුල සමදරා දෙස බැලුවේ නොසඟවාගත් කෝපයෙනි.

"මේ රෙද්දටද උඹ මට තකහනියක් එන්නඩ කිව්වෙ..?"
"මං උඹට එන්ඩ කිව්වෙ නෑනෙ.. මමනෙ එන්ඩ හැදුවෙ.."
"රූපවාහිනියෙ කැමරා කාරයෙක් අල්ලගෙන ගිහින් ඔය වැඩේ කරගන්න කියලා උඹේ ඇමතිට කියපන්.. මට වෙන වැදගත් වැඩ ගොඩක් තියෙනවා කරන්ඩ.."

"ඔය තරම් තමන් ගැන අධි තක්සේරු කරන්ඩ එපා... පොඩ්ඩක් ඉවසලා අහගෙන හිටපං.. මං මුලින්ම කිව්වෙ.. මේක වාර්තා චිත්‍රපටියක් නෙවෙයි.. අමාත්‍යාංශෙ වැඩ ගැන කියවෙන කිසියම් ආකාරයක කලාත්මක නිර්මාණයක්.. ඩඩ්ලි සේනානායක මහත්තයා අගමැති කාලෙ වගා සංග්‍රාමය ගැන කතා කරන්න රන්වන් කරල් කියල චිත්‍රපටියක් හැදුව මතකද? ඒක කලාත්මක නිර්මාණයක් නෙවෙයිද..?



චිත්‍රපටි හෝල් වල විතරක් නෙවෙයි.. ගමේ ගොඩේ පන්සලේ කමතේ ඉඳගෙනත් ඒ චිත්‍රපටිය මිනිස්සු ආසාවෙන් බැලුවෙ නැද්ද?"

"මං දේශපාලන ප්‍රචාරය වෙනුවෙන් චිත්‍රපටි හදන මිනිහෙක් නෙවෙයි කියලා උඹට නොතේරුණ එක ගැන කණගාටුයි සාමා.."

"උඹේ චිත්‍රපටි වලින් උඹ කතා කරන්නෙ දේශපාලනයම තමයි විදුල .."

"ඇත්ත .. ඒත් ඒ දේශපාලනයයි මේ දේශපාලනයයි අහසට පොළොව වගේ දුරස්.. ඒක උඹට නොතේරෙන්න විදිහක් නැහැ.. මං උත්සාහ කරන්නෙ සාමාන්‍ය මිනිස්සුන් දේශපාලනිකව දැනුවත් කරන්න.. යථාර්ථය පෙන්වා දෙන්න.. ලෝකයේ සිදුවීම් දිහා බුද්ධිමත් ලෙස බලන්න ඒ මිනිස්සු පොළඹවන්න.. රැවටීමෙන් මුළාවෙලා ඉන්න මිනිස්සුන්ගෙ ඇස් අරවන්න.. එහෙම නැතුව එක එක පඩත්තල දේශපාලකයොන්ගෙ ප්‍රචාරක වැඩ කරන්න නෙවෙයි.."

"දරදඬුවෙන්නෙ නැතිව හිතපං විදුල.. උඹේ රස්සාව නැතිවුණා.. මේ උඹට සල්ලි ටිකක් ඕනෙ වෙන වෙලාවක්.. මේ ප්‍රොජෙක්ටේ එක වෙනුවෙන් උඹේ ගාස්තුව විතරක් මිලියන් එකක් ගෙවන්න ඇමති යෝජනා කළා.."

විදුල සිනාසුණේ උපහාසයෙනි. මහත් අපුලකින් ඔහුගේ සිත පිරී තිබුණි.

"මිලියන් එකක්.." ඔහු ප්‍රතිඋච්ඡාරණය කළේ ය. " .. ඇමතිතුමාගෙ පොකට් එකෙන් වෙන්න ඇති ගෙවන්නෙ.."

ඔහුගේ උපහාසාත්මක සිනාව මගහරින්නට සමදරා ඉවත බලා ගත්තා ය.

"සාමා.. මං දන්නවා උඹ මං ගැන අනුකම්පාවෙන් තමයි මේ යෝජනාව කරන්නෙ.. ඒක මං දන්නවා.. මට සල්ලි අමාරුවක් නැහැ.. එන්ජීඕ එකේ රස්සාවෙන් මටයි නිරාෂටයි ජීවත්වෙන්න ඇති තරම් පඩියක් ලැබෙනවා.. මගේ කාර් එකට පෙට්‍රල් ලැබෙනවා.. මගේ ටෙලිෆෝන් බිල ගෙවනවා.. මට එයිට වඩා අවශ්‍යතා නැහැ.. මට ඒ හොඳටම ඇති. අපි දෙන්න මේක ගැන වාද විවාද කරගෙන වැඩක් නැහැ.. මට මේ වැඩේ කරන්න බැහැ සාමා.. එක එක දේශපාලන ව්‍යාපෘති වෙනුවෙන් චිත්‍රපට හදන්ඩ වැය කරන්න කාලයක් මට නැහැ.. එයිටත් වඩා ඒක මගේ හිතට එකඟ නැහැ.. එහෙම හිතට එකඟ නැති වැඩ මං කවදාවත් කළේ නැහැ කියලා උඹ දන්නවනෙ.. රුපියල් මිලියන් එකකටවත් ඒ ප්‍රතිපත්තිය වෙනස් කරගන්න අමාරුයි.."

සමදරා ඉදිරියට ඇදී මේසය මත වූ විදුල ගේ සුරත මත තම සුරත තැබුවා ය.

"ප්‍රතිපත්ති මත ම ජීවත් වෙන එක අමාරුයි කියලා උඹට තාමත් තේරෙන්නෙ නැද්ද විදුල? ඔය හැම ප්‍රතිපත්තියක්ම වෙනස් වෙන වෙලාවක් එනවා.. උඹ අහලා තියෙනවනෙ හැම දෙයකටම මිලක් තියෙනවා කියලා.. අද උඹ මිලියන් එකකට විකිණුනේ නැති වුණාට හෙට උඹ මිලියන් දෙකකට විකිණෙන්න පුලුවන්.. එහෙමත් නැත්නම් තුනකට.. එහෙම වෙච්ච අවස්ථා ඉතිහාසයේ ඇති තරම් තියෙනවා.. ඒවට හරි වැරදි කියන්න බැහැ.. හැමදේම සිදුවෙන්නෙ ඒ ඒ සිදුවීම සිදුවන අවස්ථාවට පසුබිමට අදාලවයි.. ඒ නිසා අදට අපි මේ මාතෘකාව මෙතනින් නවත්තමු.. ඒත් අවසානය නෙවෙයි.. ආයෙම දවසක අපි මේක ගැන කතා කරමු.. එතකල් මං ඇමතියට මොකක් හරි කියලා කල් ගන්නම්.."

"වැඩක් වෙන්න නෑ සාමා.. නිකම් මහන්සි වෙන්ඩ එපා"

"මට මහන්සියක් නැහැ බං.. මං අභියෝග වලට කැමතියි.. මේකත් මට ලැබුණ අභියෝගයක් කියලා මං හිතන්නම්.. එච්චරයි.."

මතු සම්බන්ධයි